මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය
நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சு
MINISTRY OF FINANCE, PLANNING AND ECONOMIC DEVELOPMENT


මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை.
The Secretariat, Colombo 01. Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011 - 2484500, 011 - 2484600, 011 - 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 - 2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: DMS/CIR/Allowances/2024
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2025.10. 16

කළමනාකරණ සේවා චක්‍රලේඛ: 10/2025

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
රාජ්‍ය සංස්ථා,ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල සභාපතිවරුන්

**රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් මගින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් වැනි අනෙකුත් ක්‍රියාකාරකම් මෙහෙයවන සම්පත්දායකයින්ට දීමනා ගෙවීම**

රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම් මගින් සංවිධානය කරනු ලබන පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ ධාරිතා සංවර්ධන වැඩසටහන් වැනි අනෙකුත් ක්‍රියාකාරකම් වෙනුවෙන් සම්පත්දායකත්වය ලබා දෙන නිලධාරීන් සඳහා දීමනා ගෙවීම පොදු ක්‍රමවේදයකට අනුව සිදු කිරීම අරමුණු කර ගනිමින් 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුකූලව 2025.11.01 දින සිට බලපැවැත්වෙන පරිදි මෙම චක්‍රලේඛ උපදෙස් නිකුත් කෙරේ.

02. විධිමත් අධිකාරි බලයක් සහිතව රාජ්‍ය සංස්ථා,ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල පවත්වනු ලබන ඉහත වැඩසටහන් සඳහා සම්පත්දායකයින් වශයෙන් ක්‍රියා කරනු ලබන රාජ්‍ය ආයතනවල නිලධරයන් හා විශේෂඥ දැනුම ඇති පෞද්ගලික අංශයේ සම්පත්දායකයින් සඳහා පහත පරිදි දීමනා ගෙවිය යුතුය.

| කාණ්ඩය | සම්පත්දායකයින් | අනුමත දීමනාව පැයකට |
|---|---|---|
| I කාණ්ඩය | I. පිළිගත් විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන් / මහාචාර්යවරුන් | රු. 2,400/- |
| | II. ශ්‍රී ලංකා පරිපාලන සේවය හා ඊට සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල/දෙපාර්තමේන්තුගත තනතුරුවල විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | |
| | III. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල HM 2-3, HM 2-2 හා HM 2-1 වැටුප් කාණ්ඩවලට අයත් ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරණ නිලධරයන් | |
| | IV ක්ෂේත්‍රයේ විශේෂඥ දැනුම ඇති පෞද්ගලික අංශයේ දේශකයන් (ක්ෂේත්‍රයේ දීර්ඝකාලීන පළපුරුද්ද සහිත - අවම වසර 10 ක පමණ) | රු. 2,250/- |

| | | |
|---|---|---|
| II කාණ්ඩය | I. පිළිගත් විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් | රු. 2,000/- |
| | II. ශ්‍රී ලංකා පරිපාලන සේවය හා ඊට සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල ඒකාබද්ධ සේවාවල / දෙපාර්තමේන්තුගත තනතුරුවල විධායක සේවා ගණයේ, I වන ශ්‍රේණියේ නිලධරයන් | |
| | III. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල HM 1-3, HM 1-2, HM 1-1 වැටුප් කාණ්ඩවලට අයත් ජ්‍යෙෂ්ඨ මට්ටමේ කළමනාකරණ නිලධරයන් හා AR 2 වැටුප් කාණ්ඩවලට අයත් ජ්‍යෙෂ්ඨ අධ්‍යයන හා පර්යේෂණ නිලධරයන් | |
| | IV. ක්ෂේත්‍රයේ අඛණ්ඩව වසර 10 ක් හෝ ඊට වැඩි පළපුරුද්දක් සහිත පෞද්ගලික අංශයේ දේශකයන් (SLQF Level 10 - Master Degree, NVQ Level 7 – Degree) | |
| III කාණ්ඩය | I. පිළිගත් විශ්වවිද්‍යාලයක කථිකාචාර්යවරුන් | රු. 1,800/- |
| | II. ශ්‍රී ලංකා පරිපාලන සේවය හා ඊට සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල / ඒකාබද්ධ සේවාවල/ දෙපාර්තමේන්තුගත තනතුරුවල විධායක සේවා ගණයේ, II වන ශ්‍රේණියේ නිලධරයන් | |
| | III. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල MM 1-3, MM 1-2 හා MM 1-1 වැටුප් කාණ්ඩවලට අයත් මධ්‍යම කළමනාකරණ මට්ටමේ I ශ්‍රේණියේ නිලධරයන් සහ AR 1 වැටුප් කාණ්ඩයට අයත් අධ්‍යයන හා පර්යේෂණ I ශ්‍රේණියේ නිලධරයන් | |
| IV කාණ්ඩය | I. පිළිගත් විශ්වවිද්‍යාලයක ආධුනික කථිකාචාර්යවරුන් | රු. 1,600/- |
| | II. ශ්‍රී ලංකා පරිපාලන සේවය හා ඊට සමාන්තර දීප ව්‍යාප්ත සේවාවල / ඒකාබද්ධ සේවාවල/ දෙපාර්තමේන්තුගත තනතුරුවල විධායක සේවා ගණයේ, III වන ශ්‍රේණියේ නිලධරයන් | |
| | III. රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හා සම්පූර්ණයෙන් රජය සතු සමාගම්වල MM 1-3, MM 1-2 හා MM 1-1 වැටුප් කාණ්ඩවලට අයත් මධ්‍යම කළමනාකරණ මට්ටමේ II ශ්‍රේණියේ නිලධරයන් සහ AR 1 වැටුප් කාණ්ඩයට අයත් අධ්‍යයන හා පර්යේෂණ II ශ්‍රේණියේ නිලධරයන් | |
| V කාණ්ඩය | I. උක්ත කාණ්ඩවලට අයත් නොවන නමුත් අදාළ ක්ෂේත්‍රයේ සුදුසුකම් ලත් ප්‍රවීණතාවක් හා අත්දැකීම් සහිත තැනැත්තන් | රු. 1,500/- |
| | II. ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ I/II/III ශ්‍රේණිවල නිලධරයන් | රු. 1,400/- |
| | III. ගුරු උපදේශකවරුන් | |
| | IV. ශ්‍රී ලංකා ගුරු සේවයේ I වන ශ්‍රේණියේ නිලධරයන් | |
| | V. පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරීන් | |
| | VI කණිෂ්ඨ මට්ටමේ JM 1-2, JM 1-1, , වැටුප් කාණ්ඩවලට අයත් නිලධරයන් | |

03. ඉහත වගුවේ **"පිළිගත් විශ්වවිද්‍යාලයක"** යනු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් වේ.

04. ඉහත පරිදි දීමනා ගෙවීමේ දී පහත කොන්දේසි අදාළ වේ.

**කොන්දේසි**

I. පුහුණු වැඩසටහන් , සම්මන්ත්‍රණ හා එවැනි ආකාරයේ වෙනත් වැඩසටහන්වලදී සම්පත්දායකත්වය ලබා දෙන සම්පත්දායකයින් සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ වන අතර, ඉගැන්වීම් සහ පුහුණු කිරීම් සිදු කිරීම සිය ප්‍රධාන රාජකාරිය වන ආයතනයකින් පවත්වනු ලබන වැඩසටහන් සඳහා මෙම චක්‍රලේඛ විධිවිධාන අදාළ කර නොගත යුතු ය.

II. එක් සම්පත්දායකයෙක් සඳහා දිනකට උපරිම පැය 03ක කාලයක් සඳහා පමණක් දීමනා ගෙවිය යුතු වන අතර දේශනයට ඇතුළත් කණ්ඩායම් වැඩ සහ ප්‍රායෝගික ක්‍රියාකාරකම් හේතුවෙන් අදාළ දේශනය ඉහත කාල සීමාව ඇතුළත සම්පූර්ණ කිරීම ප්‍රායෝගික නොවීම යන කරුණු මත පමණක්,

පැය 03 ක උපරිම කාල සීමාව ඉක්මවා උපරිම පැය 06 ක් දක්වා දීමනා ගෙවිය හැකිය. නමුත් ඊට අදාළ කොන්දේසි සපුරා ඇති බවට ආයතන ප්‍රධානියා පෞද්ගලිකව සෑහීමට පත් විය යුතු අතර අදාළ කාල සීමාව තුළ දේශනයේ කටයුතු අවසන් කර තිබිය යුතු ය.

III. අභ්‍යන්තර නිලධාරීන් සම්පත්දායකයින් ලෙස යොදවා ගැනීමේ දී එම කාර්යය ඔවුන්ගේ නිත්‍ය රාජකාරියට පරිබාහිර කාර්යයක් නම් පමණක් මෙන්ම නිත්‍ය රාජකාරි වේලාවෙන් පරිබාහිරව එම කාර්යයෙහි යෙදී ඇත්නම් පමණක් ඉහත සඳහන් දීමනා ගෙවිය යුතුය.

IV. කිසියම් ආයතනයක් සාමාන්‍ය රාජකාරි වේලාව තුළ තම ආයතනයේ නිලධරයන් සඳහා කිසියම් පුහුණු වැඩසටහනක් පවත්වනු ලබන්නේ නම්, ඒ සඳහා සම්පත්දායකත්වය ලබා දෙන එම ආයතනයේ නිලධරයන්ට (අභ්‍යන්තර සම්පත්දායකයන්ට) සම්පත්දායක දීමනා නොගෙවිය යුතු අතර , සාමාන්‍ය රාජකාරි වේලාවෙන් බැහැරව හෝ අදාළ ආයතනයේ නොවන නිලධරයන් සඳහා හෝ පුහුණු වැඩසටහන් පවත්වනු ලබන්නේ නම්, එවිට එම ආයතනයේ නිලධරයන්ට ද සම්පත්දායක දීමනා ගෙවිය හැකිය.

V. එසේම, සම්පත්දායකත්වය සඳහා නිලධරයන් යොදවා ගැනීමේ දී අදාළ ආයතන ප්‍රධානියාගේ අවසරය මත, සම්පත්දායකත්වය ලබා දෙන නිලධරයන්ගේ සාමාන්‍ය රාජකාරිවලට බාධාවක් නොවන සේ යොදවා ගැනීමට කටයුතු කළ යුතුය.

VI. ඉහත කාර්යයන් සඳහා වෙනත් කිසිදු දීමනාවක් නොගෙවිය යුතු ය.

05. නේවාසික පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ එවැනි ආකාරයේ වෙනත් වැඩසටහන් පැවැත්වීමේ දී ඒ සඳහා සහභාගිවන්නන් හට නවාතැන් පහසුකම් සහ ආහාර පාන සැපයීම සිදු කරන්නේ නම් , එම නිලධරයන් සඳහා සංයුක්ත දීමනා නොගෙවිය යුතු අතර , ප්‍රවාහන පහසුකම් ලබා නොදෙන්නේ නම් පමණක් පවත්නා විධිවිධාන අනුව ගමන් වියදම් ලබා ගත හැකිය.

06. පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ එවැනි ආකාරයේ වෙනත් වැඩසටහන් පැවැත්වීමට සහ ඒ සඳහා යෝග්‍ය දේශකයන් යොදවා ගැනීමට අවශ්‍ය වන අනුමැතිය ආයතන ප්‍රධානියා වෙතින් හෝ අදාළ නිසි බලධරයා වෙතින් ලබා ගැනීම මෙන්ම රජයට ඵලදායී වන ආකාරයට ඉහත කටයුතු පවත්වා ගෙන යාම ආයතන ප්‍රධානියාගේ වගකීමකි.

07. සම්පත්දායක දීමනා ගෙවීම සඳහා දැනට ලබා දී ඇති අනුමැතීන් 2025.10.31 දින දක්වා පමණක් වලංගු වන අතර , 2025.11.01 දින සිට මෙම චක්‍රලේඛ විධිවිධාන අනුව කටයුතු කළ යුතු ය.

08. මෙම චක්‍රලේඛයේ සඳහන් දීමනා හෝ ඉන් පරිබාහිර කරුණු සම්බන්ධව යම් පැහැදිලි කිරීමක්/ විමසීමක් අවශ්‍ය වුවහොත් 011 - 2484757 ඔස්සේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විමසන ලෙස කාරුණිකව දන්වමි.

ආචාර්ය හර්ෂණ සූරියප්පෙරුම
භාණ්ඩාගාරයේ ලේකම් සහ
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ලේකම්

පිටපත් :

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලය ලේකම්
4. විගණකාධිපති